PR/2018/15/S


# ජපාන තානාපති කාර්යාලය

නො 20, ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව
දු.ක :94-11-269-3831~3, ෆැක්ස් 94-11-269-8629
ඊ මේල්: cultujpn@sltnet.lk


මැයි 01, 2018

## පුවත්පත් නිවේදනය

## ජපාන රජය මහාචාර්ය කාලෝ ෆොන්සේකා වෙත ගරු සම්මානයක් පිරිනමයි

ජපාන සංස්කෘතිය ශ්‍රී ලංකාව තුල ප්‍රචලිත කිරීම ඇගයීමක් වශයෙන් "ද ඕඩර් ඔෆ් ද රයිසින් සන්, ගෝල්ඩ් රේස් විත් නෙක් රිබන්" යන සම්මානය මහාචාර්ය කාලෝ ෆොන්සේකා වෙත පිරිනැමීම 2018 අප්‍රේල් 29 වන දින ජපාන රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

ජපාන විදේශ කටයුතු අමාත්‍ය ගරු තාරෝ කෝනෝ මහතා අප්‍රේල් 29 වන දින සුබ පැතුම් පණිවුඩයක් එවමින් ප්‍රකාශ කලේ "ඔබගේ විශිෂ්ට මෙහෙවර අගයනු වස් 'ද ඕඩර් ඔෆ් ද රයිසින් සන්, ගෝල්ඩ් රේස් විත් නෙක් රිබන්' සම්මානය පිදෙන මොහොතේදී මාගේ ඉමහත් ප්‍රීතිය ප්‍රකාශ කරන අතර, ඔබහට සෞඛ්‍යසම්පන්න හා ප්‍රීතිමත් දිවියකට ආසිරි පතමි" යන්නයි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ශායනික වෛද්‍යවරයකු වන මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා 2010 වසරේදී ජපාන - ශ්‍රී ලංකා මිත්‍රත්ව සංස්කෘතික අරමුදල් සම්මාන (බුන්කා සම්මාන) කමිටුවේ සම- සභාපති ලෙස පත්කරන ලදී. ඔහුගෙන් මෙම කමිටුව වෙත ලැබුණු නායකත්වය සහ දායකත්වය බුන්කා සම්මාන ශ්‍රී ලංකාව තුල වඩාත් සුවිශේෂී තත්වයකට ගෙන ඒමටත් එම තත්වය ස්ථායීව පවත්වා ගැනීමටත් වඩාත් ඉවහල් විය.

වර්ෂ 1993 දී ස්ථාපනය කරන ලද බුන්කා සම්මාන ශ්‍රී ලංකාවේ වඩාත් ගෞරවාන්විත සම්මාන ප්‍රදානයක් වන අතර, එහි අරමුණ වන්නේ විශිෂ්ට දක්ෂතා පෙන්වන මධ්‍යම- මට්ටමේ ශ්‍රී ලාංකික කලාකරුවන් නගාසිටුවීමයි. මෙම සම්මාන වාර්ෂිකව පිරිනැමෙන අතර, මේ දක්වා කලාකරුවන් රැසකගේම කුසලතා වර්ධනය කරගැනීමට දායක වී ඇත. බුන්කා සම්මාන වර්ධනය කරගැනීම සඳහා මහාචාර්ය ෆොන්සේකාගේ දීර්ඝකාලීන කැපවීම ඇගයීමට ලක් කෙරේ.

**********************************************************

වැඩි විස්තර සඳහා සංස්කෘතික අංශය අමතන්න
දු.ක :94-11-269-3831~3 ( දිගුව- 227)